# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1516/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 27/09/2024 පැය 0915

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.09.26 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීමක් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 18 | - | - |

වැටලීමෙන් අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල ඇළපාත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. අනවසරයෙන් මැණික් ගැරූ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර**

2024.09.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අවිස්සාවේල්ල පොලිස් වසමේ සීතාවක පාලම අසල ප්‍රදේශයේ වැටලීම් දෙකක් සිදු කර කැළණි ගං ඉවුර බාදනය වන සේ අනවසරයෙන් මැණික් ගැරූ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 15, 36 සහ 39 වයස් වල පසුවන අවිස්සාවේල්ල සහ පුවක්පිටිය යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**03. හඳුනා නොගත් මත්කරල් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.09.26 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ත්‍රිකුණාමල පොලිස් වසමේ මට්කෝ දුම්රිය පොළ පාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර හඳුනා නොගත් මත් කරල් 140 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ පාලඋත්තු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඒරගම කඳවුර**

2024.09.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඒරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඒරගම පොලිස් වසමේ ඒරගම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 650ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඒරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ වරිපතන්චේන 02 , ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ඒරගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**